# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණ කාලීන)
දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2016

CU 509 - පාසල් උපදේශනය

**කාලය පැය තුනයි**

I කොටසේ ප්‍රශ්න සියල්ලටම ද II කොටසේ ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.

---

## I - කොටස

1. i. උපදේශනයේ අරමුණු තුන නම් කරන්න.

ii. "කොන්දේසි විරහිත ධනාත්මක සැලකිල්ල" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

iii. "සහකම්පනය" කෙටියෙන් පැහැදිලි කරන්න.

iv. "විභාග භීතිකාව" (Exam Phobia) යනු කුමක්ද?

v. සමාජමිතික ක්‍රමය යටතේ සාකච්ඡා වන "සමාජ කල්ලි" යනු කුමක්ද?

vi. චර්යාවදී න්‍යායට අනුව පුද්ගල ගැටලුවකට උදාහරණයක් නම් කරන්න.

vii. සාංදෘෂ්ටිකවාදී න්‍යායට අනුව පුද්ගලයා එක විට ලෝක තුනක ජීවත් වේ. ඒ මොනවාද?

viii. උපදේශන සැසියක් ක්‍රියාත්මක කිරීමේ දී ආසන සංවිධානය කල යුතු ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

ix. පාසල් උපදේශන මධ්‍යස්ථානයක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු භෞතික පරිසරයට අදාළ සාධක <u>හතරක්</u> නම් කරන්න.

x. උපදේශනය සඳහා ශිෂ්‍ය සේවාලාභියෙකු ජ්‍යෙෂ්ඨ උපදේශකවරයකු සඳහා යොමු කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු <u>දෙකක්</u> සඳහන් කරන්න.

(ලකුණු 2x10 = 20)

## II - කොටස

1. i. "උපදේශනය" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 5)

   ii. උපදේශනය හා උපදෙස් දීම යන සංකල්ප අතර පවත්නා වෙනස්කම් හයක් පැහැදිලි කරන්න. (ලකුණු 7)

   iii. ලංකාවේ උපදේශන සේවාව ආරම්භයේ සිට වර්තමානය දක්වා විකාශනය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8)

2. i. උපදේශනයේ විවිධ ක්ෂේත්‍ර නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

   (ලකුණු 6)

   ii. ශ්‍රී ලංකාවේ ද්විතිය පාසල්වල, උපදේශන සේවාවක් අවශ්‍ය වන ගැටලු ලැයිස්තුගත කරන්න. (ලකුණු 7)

   iii. පාසල තුළ විධිමත් උපදේශන සේවාව නැතිකමින් සිදුවන අධ්‍යාපන නාස්තිය කෙබඳු ද යන්න උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 7)

3. i. උපදේශනයේ සච්චාරිත්‍ර ධර්ම (code of ethics) අතුරින් පොදු ආචාර ධර්ම 04 ක් නම් කර පාසල් උපදේශකවරයා එම ආචාර ධර්ම පාසල තුළ ආරක්ෂා කිරීමේ ඇති වැදගත්කම උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

   (ලකුණු 10)

   ii. උපදේශකවරයා සතු පෞරුෂ ගුණාංග 05 ක් ඉදිරිපත් කර එම පෞරුෂ ගුණාංග උපදේශන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට වැදගත් වන ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

   (ලකුණු 10)

4. i. වෘත්තීය ගුරුවරයකු වශයෙන් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීමේ දී ඔබ උගත් වෘත්තීය මාර්ගෝපදේශන න්‍යායන් ඉවහල් කරගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. අසාමාන්‍ය ශිෂ්‍ය චර්යාවක් අධ්‍යයනය සඳහා නිරීක්ෂණ ක්‍රමවේදය සාමාන්‍ය පන්තිකාමර ගුරුවරයාට භාවිත කළ හැකි ආකාරය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

5. i. මනෝ විශ්ලේෂණවාදී න්‍යායට අනුව ගැටලුවක් ඇති වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

ii. කාල් රොජර්ස් පෙන්වා දෙන පුද්ගලයා පිළිබඳ සංකල්පය (concept of the person) උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

6. i. උපදේශනයේ "ප්‍රාරම්භක චර්යා" උපදේශන ක්‍රියාවලියේ දී මෙන්ම පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදෙන ගුරුවරයාට ද ඉතා වැදගත් වේ. මෙම කියමන උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

ii. "සක්‍රීය සවන්දීම" සාර්ථක උපදේශන ක්‍රියාවලියකට පදනම වෙයි. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

○∘○∘○∘○∘○∘○∘○∘○∘